" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொது தொலைபேசி / General Telephone — 011 - 2093000

SLSI ISO 9001 — SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/ADM/18-38/FI/01-2020 — ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } — දිනය / திகதி / Date } 2020-06- 08

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම්(බ.ප),
ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන ඒකකය),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/ පරිපාලන නිලධාරි,

**කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හා 05/2016 බස්නාහිර පළාතට අදාල කර ගැනීම.**

පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/2/19/01/2020 හා 2020.03.20 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත. (එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020, 2020-02-21 | සියලු බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016, 2016-12-29 | රජයේ වාහන නඩත්තු කිරීම |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2020, 2020-02-20 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/88 හා 2019 අගෝස්තු මස 23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙසත් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් (බ.ප.) වෙනුවට.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 05/2020

මගේ අංකය : MPA/ASD/03/ASMIN 01
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2020.02.20

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/88 හා 2019 අගෝස්තු මස 23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට සහ දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේ අවම සේවා කාලය සංශෝධනය කිරීමට අදාළ විධිවිධාන ඇතුළත් කර අංක 2137/88 හා 2019 අගෝස්තු 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවේ පස්වන සේවා ව්‍යවස්ථා සංශෝධනය අනුව දැනට සේවයේ සිටින ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් කිරීම් පහත පරිදි සිදු කරනු ලැබේ.

**1. තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට උසස් කිරීම.**

1.1 2019 පෙබරවාරි 26 දිනට පෙර සේවයට බඳවා ගෙන ඇති නිලධාරීන් සංශෝධිත ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දිනය හෝ 2019 පෙබරවාරි මස 26 දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

1.2 ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 හි අනු අංක VI යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති සහන කාලය තුළ සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් නියමිත දිනට අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාව සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන් ලෙස සලකනු ලබයි.

1.3 ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 හි අනු අංක VI යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති සහන කාලය තුළ සම්පූර්ණ නොකරනු ලබන නිලධාරීන් සඳහා එම චක්‍රලේඛ සහ ඊට අනුශාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අදාළ වේ.

1.4 මෙම සංශෝධන ක්‍රියාත්මක වන දිනට III ශ්‍රේණියේ වසර හය (06) ඉක්ම වූ, සක්‍රිය හා සතුටුදායක සේවා කාලය II ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය ලෙස සලකනු ලබයි.

**2. දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීම.**

2.1 සේවා ව්‍යවස්ථාවේ පස්වන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට පෙර, II ශ්‍රේණියේ සිටින නිලධාරීන් සහ III වන ශ්‍රේණියේ වසර හයකට (06) වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා පහත කරුණු අදාළ කර ගනු ලැබේ.

(අ) II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වීම සඳහා ලබා තිබිය යුතු 10.2.1 හි අනු අංක (V) යටතේ සඳහන් පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කර ගැනීම සඳහා II ශ්‍රේණියට උසස්වී වසර හතක (07) සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනය හෝ 2025.02.20 දිනය යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා සහන කාලයක් ලබා දෙනු ලබන අතර එම සහන කාල සීමාව තුළදී අදාළ සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව 10.2.1 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්රේණියට උසස් කරනු ලැබේ.

(ආ) II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වීම සඳහා ලබා තිබිය යුතු 10.2.1.1 හි අනු අංක (IV) යටතේ වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර ගැනීම සඳහා II ශ්‍රේණියට උසස් කරනු ලැබූ දිනයේ සිට වසර තුනක (03) සහන කාලයක් ලබා දෙන අතර එම සහන කාල සීමාව තුළදී අදාළ සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව 10.2.1 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

2.2 සේවා ව්‍යවස්ථාවේ පස්වන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට පෙර, II ශ්‍රේණියේ සිටින නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේදී 10.2.1 හි (i) සහ (iii) යටතේ සඳහන් කර ඇති සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

(අ) II ශ්‍රේණියේ වසර දෙකක (02) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

හා II ශ්‍රේණියට උසස්වීමෙන් පසු වැටුප් වර්ධක දෙකක් (02) උපයාගෙන තිබීම.

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව II ශ්‍රේණියට උසස්වීමෙන් පසු උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දෙකක් (02) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

<u>සටහන :</u>

මෙම සංශෝධනය ක්‍රියාත්මක වන දිනට නිලධාරියෙකුගේ II ශ්‍රේණියේ වසර දෙකකට (02) වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලය උසස් කිරීමේ කාර්යය සඳහා I ශ්‍රේණියේ සේවා කාලය ලෙස සලකනු ලබයි.

2.3 සේවා ව්‍යවස්ථාවේ පස්වන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට පෙර, III වන ශ්‍රේණියේ වසර හයකට (06) වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම චක්‍රලේඛයේ 1.1 හි දක්වා ඇති විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේදී 10.2.1 හි (i) සහ (iii) යටතේ සඳහන් කර ඇති සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

(අ) III සහ II ශ්‍රේණිවල වසර දොළහක (12) සක්‍රීය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක එකොළහක් (11) උපයාගෙන තිබීම.

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දොළහක් (12) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව නිකුත් කරනු ලැබේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය